*Vidyodaya J. Arts, Sci., Lett., Vol. 5 Nos.* 1f2 *pp.* 42—46, 1972 - 1976

# ‘මහවන් හෙළිල්ලබු . . .’ යනාදි සීගිරි පද්‍යපාඨයෙහි අර්ථ කථනය

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යොදය මණ්ඩපයේ සිංහල අධ්‍යයනාංශයේ
ඒ. වී. සුරවීර විසිනි

මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සම්පාදනය කළ ‘සීගිරි කැටපත් පවුරු ගී’ නම් ග්‍රන්ථයෙහි[1] පද්‍ය කීපයක ම යෙදෙන පාඨයක් නම් ‘මහ වන් හෙළිල්ලබු.........’ යන්නයි. ‘සමා වනු එළලු කතුනි’ යි එයට අර්ථ කියා ඇත.[2] මෙම කෙටි ලිපියෙන් පූර්වොක්ත අර්ථ කථනය පිළිබඳ විමර්ශනයක් කෙරේ.

සීගිරි ගී අතර ‘මහ වන් හෙළිල්ලබු.........’ යන්න හෝ ඊට ආසන්න පාඨයක් හෝ යෙදී ඇති තැන් මෙසේය:

බෙයන්ද්හි දිග්නෙත් මහ වන් හෙළිල්ලබුයුන්
අවු[ජ් තුට්] සිත් කළ මරණෙක් දැකැ නො මුස්නොය් මය්. (අංක 12)

ජනු (යනුයුන්) මෙ ලී මහ වන් හෙළිල්ලම්බියෙන්
කවර් දෙසෙ ආම මග් මෙ මැ සැනිනි යත් කො ද බැහැර් මග්. (අංක 35)

......................

නැහැජිනැ ඉද් නාම් වරජක් මම් කෙළෙම් නම් තිපි
සහව වරජකජ් ඇත මහ වන් හෙළිල්ලම්බියෙන්. (අංක 75)

වෙළල අ අමහ අරකට ල මෙ ගලෙ
සෙ ක[නු]න ලයු ලන මහවන හෙළිල(ලබුයුන).(අංක 159)

නොවි සිහි යන්නමහ මහ වන් හෙළිල්ල[බි]යැන්
නො හිඳැ යැ(ත) මෙතැනින සෙද ම මන සිටිය නො වන්නෙන්. (අංක 180)

ලබුපලුවක ළ සෙය් කත්නි මල්දමක් ගත් සෙ
යම්හ යි හෙළිල්ලබු ගියෙ මහ වන් බෙයන්ද්හි කිපි සෙයි. (අංක 373)

මෙයට අමතර ව ‘හෙළිල්ලබු’ යන්න සමඟ නො ව තනි ව ‘මහවන්’ යෙදෙන එක් ගියක් ද ඇත. එනම්:

බල [ත] මෙ තො[ප සිහි] නො වුයු ද වී [ලැ] ස් තොපට
මන [හැ] පි උන්නො [ස] න්ද්හ [න් නැ]හියින් ඔයුන් මහ වන්. (අංක 534]

1. S. Paranavitana, *Sigiri Graffiti* (*Being Sinhalcse Verse of the Eighth, Ninth, and Tenth Centuries*) Vol. 1 & 2, Oxford University Press, 1956.
2. Ibid, Vol. II pp. 7, 21 etc. (Forgive, O fair damsels)

මෙම ගී අතුරින් 159 වන ගියෙහි හැර අනෙක් සෑම තන්හි 'මහ' යන පදය සංස්කෘත 'ක්ෂමා' (ක්ෂම්–ධා. ක්ෂමා > සමා > හම > මහ) යන්නෙන් බිඳුණක් ලෙස සලකා 'මහ වන්' යන්නට 'සමා වනු' (forgive) යි අරුත් දෙන අතර 'හෙළිල්ලබූ', 'හෙළිල්ලබි' යනාදි පාඨයට 'රුමත් කාන්තාව' (fair damsel) යන අරුත් දී ඇත. 159 වැන්නෙහි 'මහවන' යන පාඨයට පමණක් 'මහා වනය' (great forest) යි අරුත් කියන ලදි. 'මහ වන් හෙළිල්ලබූ.........'යි යෙදුණ තන්හි 'සමා වනු රුමත් කතුනි' කියා ද, 'මහවන හෙළිල්ලබූ. . . . '(159) යන තන්හි 'මහා වනයෙහි රුමත් කතුනි' කියා ද අර්ථ දක්වීම නිසා එම අර්ථ කථනය කෙරෙහි සැක පහළ කිරීමට සිදු වෙයි.

අංක 35, 75 යන ගීවල 'හෙළිල්ලම්බියෙන්' යනු ආලපන විබත් බහු වචන රූපයක් සේ ගනිමින් 180 වැන්නේ එන 'හෙළිල්ලබියැන්' යන්න ද ඒ අයුරින් ම ආලපන බහු වචන රූපයක් සේ සලකා ඇත.[3] මේ එක ම රූපය නිසා –ඇන් අන්ත ආලපන විබත් රූපයක් ඇති බවක් පැවසීමට ද සිදු විය.[4] එපමණක් නොවේ. ගී දෙකකින් යුත් අංක 180 වේ දෙවැන්න මුල් ගීයට පිළිතුරක් වශයෙන්[5] ලියා තිබිය දී, එහි 'මහ වන් හෙළිල්ලබියැන්' යනු විසින් එළලු කතුන්ගෙන් සමාව අයැදීමෙන් අර්ථය අවුල් වී යයි.

එසේ ම පූර්වෝක්ත පාඨය සම්බන්ධ ව තවත් නිරීක්ෂණ කීපයක් ඉදිරිපත් කළ හැකිය. ගී අංක 12, 35, 75, 180 යන තන්හි 'මහ වන් හෙළිල්ලබූ ........' යනාදි පාඨය එකට ම පද පිළිවෙළ ද වෙනස් නොවී යෙදී ඇති අතර 373 වැන්නේ යෙදී ඇත්තේ 'හෙළිල්ලබූ ගියෙ මහ වන්' යනු විසින් පද පිළිවෙළ අතින් වෙනස් ආකාරයකිනි. 534 වැන්නේ යෙදී ඇත්තේ 'මහ වන් හෙළිල්ලබූ.........' යනාදි ලෙසින් නොව 'මහ වන්' යි තනි වය. මෙහි 'මහ වන්' යන්නට ඉදිරියෙන් 'ඔයුන්' යි යෙදේ.

'මහ වන්' යන්නට 'සමා වනු'යි අරුත් දී ඇති පූර්වෝක්ත පද්‍යයන්ගෙන් කීපයක අර්ථ කථනයේ සිංහලානුවාද මෙසේය:

> බෙයදහි දිගැසිය සමා වනු. (මෙහි) ආ මගේ සිත රුමත් කතුන් විසින් සතුටු කෙරිණ. (ඔවුන්) දුටු විට මරණය පවා මා වික්ෂිප්ත නොකරයි. (12 වන ගීය)

> (ආපසු) යන්නවුන් විසින් මෙය ලියන ලද බව දනුව. සමා වනු, රුමත් කතුනි. කවර දෙසින් අව ද මේ මග ම පෙනිණ. බැහැර යන කල මගක් කොයින් ද? (35 වන ගීය)

මේ පද්‍ය දෙක්හි මෙන් ම අනෙක් තන්හි ද අර්ථ දක්වා ඇති සැටියෙන් කාන්තාවන්ගෙන් සමාව අයැදීමක් ගැන කියවේ. එහෙත් තව දුර විභාග කිරීමේ දී, එම පද්‍ය රචකයන් කතුන්ගෙන් සමාව අයැදීමට තරම් වරදක් කර ඇද්දැයි සැක පහළ වේ. එළලු කතුන් තමන්ගේ (කවියාගේ) සිත සතුටු කළ බව හා ඔවුන් දුටු කල්හි මරණයෙන් පවා කැලඹීමක් ඇති නොවන බවත් සඳහන් කිරීම (අංක 12) ද, එද්දී කවර දෙසින් අව ද කතුන් සිටි දෙස ම පෙනුණත් බැහැර යන කල මාර්ගයක් නොපෙනෙන බව කීම (අංක 35) ද, රජුගේ ගුණ සිහි කරමින් සිටින කතුන් හැඳින නොගත් බව කීම (අංක 75) ද, කතුන් සිහි නොකර ඔවුන් අමතක කර දමා පර්වතයෙන් බැහැර යාම (අංක 180) ද යනාදි කරුණු ඔවුන්ගෙන් සමාව අයැදීමට තරම් ප්‍රමාණවත් දැයි සිතා ගත නොහැකිය. මෙයට වඩා

3. Ibid, Vol. II p. 112, fri. II 8 verse 180.
4. Ibid, Vol. I Intro. p. CXIII.
5. Ibid, Vol. II See fn. 12 verse 180.

දැඩි ලෙස සීගිරි කතුන් දෝෂාරෝපණයට භාජන කළ කවීහු ද, හිමියා මළ සොවින් දුක් වෙද්දී ඒ රූමත් කතුන්ගේ සිත් දිනා ගනිමින් ඔවුන් වරදෙහි පොළඹා ගැනීමට ඉදිරිපත් වූවාහු ද ඇතැම් විට ඔවුන් සමා කරවා ගැනීමට නොසිතූහ. 'මහ වන්' යන පාඨයෙන් 'සමා වනු' යන අරුත් ලැබේ දැයි වැඩි දුරටත් සැක පහළ වනුයේ එහෙයිනි.

මෙම පාඨයේ අර්ථ කථනය පිළිබඳ සැකය තහවුරු වනුයේ 75 වන ගීය විමසීමෙනි.

නැහැජිනැ ඉද් නම් වරජක් මම් කෙළෙම් නම් තිපි
සහව වරජකජ් ඇත මහවන් හෙළිල්ලම්බියෙන්.

'තොප නොහැඳින ඉදිම් නම්, මම් වරදක් කෙළෙම් නම්, වරදක් ඇතොත් ඉවසව' යි මෙහි පැහැදිළි ලෙස ම පවසා ඇත. 'වරජක් ඇතොත් සහව' කියා එතන්හි ම යළි 'සමා වනු' යන අරුත් සඳහා 'මහ වන්' යන්නක් යෙදීම අනවශ්‍ය සේය.

අනෙක් අතින් 'ක්ෂමා' යන පදය හා කෙළින් ම සම්බන්ධ වන පාඨයක් සීගිරි පද්‍ය අතුරෙහි තුන් පළක ම යෙදී ඇත. ඒ මෙසේය: 'හිමබ අකමය වය' (143), 'තිප අක්මය් වයූ'(190), 'අකමය වය' (250). මේ සංස්කෘත 'ක්ෂමා' යන්න සීගිරි කවීන් භාවිත කළ සැටියි. මේ පද්‍යයන් ගැන සලකන කල නම් කවියාට කතුන්ගෙන් සමාව අයැදීමට ප්‍රමාණවත් තරම් කරුණු ඇති බව පෙනේ. 'පෙර කල ඇගේ ජීවිකාව (චරිතය) කෙබඳු වී දැයි දනිමු. (ඇය) පිළිබඳ ව අප විසින් ගී රචනා කරන ලද වුව නිල් උපුල් පැහැය ගත් මේ තැනැත්තී (අනිකකු එන තුරු) මග බලා සිටින්නීය. ඇය කළ දේ හොඳේ!' යනුවෙන් 250 වන ගීය ගැයූ කවියා සමාව අයැදිනුයේ ඇගේ චරිතය ගැන මෙසේ දෙස් දක්වූ හෙයිනි.

'මහ වන් හෙළිල්ලබු. . . . ' යනාදි පාඨය සඳහා වඩා යෝග්‍ය අනෙක් අරුතක් ඇද්දැයි බලනු වටී.

'හෙළිල්ලබු' යන පදයට 'ධවලාඞ්නා තොමෝ'[6], 'ගෞරවණී ඇත්තී'[7] යන අරුත් පමණක් නොව 'එළලූ පැහැ ඇත්තී'[8] 'මනොඥ කාන්තාව'[9] යන අර්ථ ද දිය හැක්කේය. 'සුදු පැහැ ඇත්තී' යන අරුත් ඇතත් 'හෙළිල්ලබු' යන පදය ව්‍යවහාරයේ දී 'එළලූ පැහැ ඇත්තී', 'රූමත් කාන්තාව', 'මනොඥ කාන්තාව' යන අර්ථ ගැනීම යුක්ති යුක්ත ය. මේ අනු ව පරණවිතාන ගුරින් විසින් 'හෙළිල්ලබු' යන පදය 'fair damsels' යි පරිවර්තනය කරනු ලැබීම සම්පූර්ණයෙන් නිරවද්‍යය.

සීගිරි කවියෝ සීගිරි සිතුවම්හි කතුන් පැහැය විසින් දෙකොටසකට බෙදූහ. එක් කොටසක් රන්වන්නූය. සෙස්සෝ නිල්වන්නූ හෙවත් මහනෙල්වන්නූය.

මහනෙල්වනක් මෙ දුට බෙයන්ද්හි රන්වනුන් අතුරෙ (170)

.........මහනෙල්වනුන් අතුරෙ
බෙයන්ද්හි රන්වනුන් හින්දිනු......... (263)

---

6. හික්කඩුවේ ශ්‍රී සුමංගල, සිදත්සඟරා සන්නය, 4 වන මුද්‍රණය, 1914, 132 පි.
7. එම 122 පි.
8. එම 51 පි.
9. වැලිවිටියේ සෝරත, ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ද්විතීයභාගය, 1137 පි.

නිල්කටරොළ මලෙකැ ඇවුණු වැටකොළ මල සෙය්
.............මහනෙල්වන හය් රන්වන හුන් (334)

එසේ ම, 'හෙළිල්ලබු.........' යන්න රන්වන් කතුන්ට මෙන් ම නිල්වන් කතුන්ට ද යොද ඇති බව පෙනේ.

'හෙළිල්ලබු' යන පදය රන්වනුන් බලා ගෙන යොද ඇති තැන්වලට උදාහරණ:

බෙයන්දඟි රන්වනුන් බලන් සිතැ ආ සිහිල
හෙළිල්ලබුයුන් නො බෙණෙන ජහ යම්හ උන් අතුරෙන් (412).

කසුන් ලියක් සෙ දිසි බෙයඳඟි හෙළිල්ලම්බු මෙහි
අතින් මල් ගත්ති සිටි නො දැකි සෙය් තොප මෙතකුද් (546).

'හෙළිල්ලබු' යන පදය මහනෙල්වනුන් බලා ගෙන යෙදීමට උදාහරණ :

මහනෙල්වනින් එ ක දටය මෙ මෙ හෙළිල්ලබු යෙ
තොප මෙනෙහි පුලුද් මෙ නෙ වී යි අහන නො කා කොට දිට . (626)

මේ අනු ව 'හෙළිල්ලබු' යන්න සීගිරි කවීන් විසින් රන්වන් කතුනට මෙන් ම නිල්වනුන් හට ද අවිශේෂයෙන් යොදන ලද පදයක් බව තීරණය කිරීම අපහසු නොවේ.

එසේ ම පූර්වෝක්ත 'මහ වන් හෙළිල්ලබු' යනාදි පාඨයෙහි එන 'මහ වන්' යන්න 'හෙළිල්ලබු' යන පදයට ම විශේෂණ වශයෙන් හෝ මනොඥ කාන්තාවන් වෙනුවෙන් හෝ යෙදූ පදයක් බව සැලකීම වඩාත් යුක්ති යුක්ත සේ පෙනේ. සීගිරි ගී විමසීමේ දී 'රන්වන්', 'මහනෙල්වන්' යනාදි තන්හි පමණක් නොව වෙනත් විශෙෂණ සමඟ ද 'වන්' රූපය යෙදී ඇති බව පෙනෙයි. උදාහරණ:
කළුවන් (170), දුල්වන් (378–දිලිසෙන වර්ණ ඇති), නිල්වන් (680), තමලවන් (604–තඹවන්, තමාල වර්ණ), බිඹවන් (617) වර්වන් (347–උත්තම වර්ණ), වන බැවින් (67–වර්ණ භාවයෙන්). මෙහි 'වන්' යෙදී ඇත්තේ ව–වීමේ ධාතු බලා ගෙන නොව 'වර්ණ' යන අරුත් බලා ගෙන ය. 'වන්' යන්න ක්‍රියා පදයක් සේ යෙදී ඇත්තේ 'නො වන්' යනුවෙන් 301, 561 යනාදි ගී කීපයක පමණක් සේ පෙනේ.

මෙම කරුණු අනු ව 'මහ වන්' යන පාඨයෙන් ද කිසි යම් වර්ණයක් අදහස් කෙරෙන බව සැලකීම වඩාත් සාධාරණ ය. එසේ ගත හොත් මෙකියන 'මහ' වර්ණය කුමක් විය හැකි ද? මෙයට පිළිතුර ද සීගිරි ගී තුළින් ම ලැබේ.

බෙයඳිහි සම්වනක්......... (230)

......බෙයදඟි සම්වනක්......... (233)

මහනෙල පැහැ සමවනක......... (355)

මේ ආදි තන්හි 'සම්වන', 'සමවන' යන පද යෙදී ඇත්තේ 'ශ්‍යාමවර්ණ තැනැත්තිය' යන අර්ථ දීම සඳහා ය. සංස්කෘත 'ශ්‍යාම' යනු 'සම' ඔස්සේ ස කාර හ කාර වී, යළි වණ පෙරළි නිසා 'මහ' යි සිද්ධ වේ.

සපු කුසුමත්නි ගත් මය් මන දකුත් සම්වන්
ගැහැනිලිය තන ලී බෙයඳුහි රන්වනැන් අනුරෙ (232)

යන ගීයෙහි රන්වනුන් හා නිල්වනුන් හැඳින්වීම සඳහා පිළිවෙළින් 'රන්වනැන්', 'සම්-වන්' යන පද භාවිත කෙරේ.

'හෙළිල්ලබු.........' යනාදි පාඨය රන්වන් කතුනට විශෙෂ වූ පදයක් නොව, පොදුවේ රන්වනුන්ට මෙන් ම නිල්වන් කතුන් හට ද යෙදී ඇති සැටි යට පෙන්වා දෙන ලදි.

මේ අනු ව සලකන කල, 'මහ වන් හෙල්ලල්බු ' යනාදි පාඨයට 'සමා වනු එළලු කතුනි' යි අරුත් පවසනවාට වඩා 'ශ්‍යාම වර්ණ මනොඥ කාන්තාව'යි අර්ථ දැක්වීම යෝග්‍ය බව කිව මනාය.

එසේ ගත් කල්හි යට දක්වූ 'මහවන හෙළිලලබුයුන' යන 159 වන ගී පාඨයට පමණක් 'මහවනයෙහි රුමත් කතුන්' යි අනෙක් අර්ථයක් දීමේ ගැටළුව ද විසඳා ලිය හැකි වෙයි.

වෙළල අ අමහ අරකට ල මෙ ගලෙ
සෙ කතුන ලයු ලන මහවන හෙළිලලබුයුන. (159)

යෝජිත පද පිළිවෙළ: අ අරකට වෙළල මෙ ගලෙ ල අමහ. මහවන හෙළිලලබුයුන කතුන ලන සෙ ලයු.
අර්ථ: හා! ආරක්ෂාව සඳහා සිහින් සිරුරු ඇත්තිය (–වෙළල) මේ ගලෙහි තබා (අපි) ආම්හ. ශ්‍යාමවර්ණ මනොඥ කාන්තාවන් තැබූ ආකාරය සැබවින් ම යහපත්.

තව ද, 'මහවන්' යන්නට 'ශ්‍යාමවර්ණ' යන අර්ථය දුන් කල්හි යට දක්වූ 180 වැනි ගීයේ ආලපන විබත් අවුල ද ලිහේ.

නොවි සිහි යන්තමහ මහවන් හෙළිල්ලබියැන්
නො හිඳැ යැත මෙතැනිත සෙද ම මන සිටිය නො වන්නෙන්. (180)

යෝජිත අර්ථ: ශ්‍යාමවර්ණ මනොඥ කාන්තාවන් සිහි නොවී (නොකර) යමු. (මෙතන්හි) නොහිඳ වහා මෙතැනින් යන කල මසිත මෙහි නොසිටියි (නොරැඳෙයි).

'හෙළිල්ලබියැන්' යන්න මෙම පද්‍යයෙහි යෙදී ඇත්තේ පරණවිතාන ගුරින් පවසන අයුරු ඒ පාඨයට පමණක් සීමා වූ ආලපන විභක්ති රූපයකින් නොව කර්ම විභක්තියෙන් බව පෙනේ.

එසේ ම 534 වැනි ගීයෙහි 'ඔයුන් මහවන්' යන පාඨයට ද 'ඔවුන් සමා කරනු' කියා නොව 'ශ්‍යාමවර්ණ වූ ඒ කාන්තාවන්' යි අර්ථ දීම වටී.